# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# කිතුල් සංවර්ධන මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු

**කිතුල් සංවර්ධන මණ්ඩලය පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. සහකාර / නියෝජ්‍ය කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන) - තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද**

- **බාහිර අයදුම් කරුවන් සඳහා**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන /කළමනාකරණ /අලෙවිකරණ/ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

**හෝ**

තනතුරට අදාළ විෂය කේෂ්ත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ කේෂ්ත්‍රයේ වසර (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා ඇති කිතුල් සංවර්ධන මණ්ඩලයේ සේවයේ නියුතු වූවකු වීම.

**හෝ**

II. කණිෂ්ඨ කළමනාකර JM සෙවා ගණයේ අදාල කේෂ්ත්‍රයේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.

| | | |
|---|---|---|
| **වැටුප් කාණ්ඩය** | - | **MM-1-1 2016** |
| **වැටුප් පරිමාණය** | - | රු.53,175 - 10 X 1,375-15 X 1,910-95,575 |
| **වයස** | - | අවු.22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. ( අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.) |
| **බඳවා ගැනීමේ ක්‍රමවේදය** | - | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කෙරේ. |

## 02. සහකාර / නියෝජ්‍ය කළමනාකරු (පර්යේෂණ) - තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද**

- **බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව විෂය කේෂත්‍රයට අදාලව කෘෂිකර්මය විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ ,රාජ්‍ය සංස්ථාවක,මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ කේෂ්ත්‍රයේ වසර (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා ඇති කිතුල් සංවර්ධන මණ්ඩලයේ සේවයේ නියුතු වූවකු වීම.

**හෝ**

II. කණිෂ්ඨ කළමනාකර JM සේවා ගණයේ අදාල කේෂ්ත්‍රයේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.

| | | |
|---|---|---|
| **වැටුප් කාණ්ඩය** | - | **MM-1-1 2016** |
| **වැටුප් පරිමාණය** | - | රු.53,175-10 X 1,375-15 X 1,910-95,575 |
| **වයස** | - | අවු.22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ. |

## 03. සහකාර/නියෝජ්‍ය කළමනාකරු (මූල්‍ය) - තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද**

- **බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍යකරණ / ගණකාධිකරණ / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

**හෝ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ,රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ කේෂ්ත්‍රයේ වසරක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා ඇති කිතුල් සංවර්ධන මණ්ඩලයේ සේවයේ නියුතු වුවකු වීම.

**හෝ**

II. කණිෂ්ඨ කළමනාකාර JM සේවා ගණයේ අදාල කේෂ්ත්‍රයේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.

| | | |
|---|---|---|
| **වැටුප් කාණ්ඩය** | - | **MM-1-1 2016** |
| **වැටුප් පරිමාණය** | - | රු.53,175-10 X 1,375-15 X 1,910-95,575 |
| **වයස** | - | අවු.22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය.(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.) |

## 04. අභ්‍යන්තර විගණක - තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද**

- **බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මුල්‍යකරණ /ගණකාධිකරණ/ ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

**හෝ**

තනතුරට අදාළ විෂය කේෂ්ත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා ඇති කිතුල් සංවර්ධන මණ්ඩලයේ සේවයේ නියුතුවුවකු වීම.

**හෝ**

II. කණිෂ්ඨ කළමනාකරණ JM සේවා ගණයේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.

**වැටුප් කාණ්ඩය** - **MM-1-1 2016**

**වැටුප් පරිමාණය** - රු.53,175-10 X 1,375-15 X 1,910-95,575

**වයස** අවු.22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය.(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

## 05. පරිපාලන නිලධාරි - තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද**

- **බාහිර අයදුම් කරුවන් සඳහා**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර පරිපාලන හෝ කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

**හෝ**

තනතුරට අදාළ විෂය කේෂ්ත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

II. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1) සේවා ගණයන්හි II ශ්‍රේණියේ අදාළ ක්ෂත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් කාණ්ඩය** - **JM-1-1-2016**

**වැටුප් පරිමාණය** - රු.42,600-10X755-18X1,135-70,580

**වයස** - අවු.22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය.(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

## 06. පර්යේෂණ හා සංවර්ධන නිලධාරි - තනතුරු 02

**සුදුසුකම් හා පළපුරුද්ද**

- **බාහිර අයදුම් කරුවන් සඳහා**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව (විෂය ක්ෂත්‍රයට අදාළව)/කෘෂිකර්මය /ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

II. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA1) සේවා ගණයන්හි II ශ්‍රේණියේ අදාළ ක්ෂත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| **වැටුප් කාණ්ඩය** | - | **JM-1-1-2016** |
| **වැටුප් පරිමාණය** | - | රු.42,600-10X755-18X1,135-70,580 |
| **වයස** | | අවු.22ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.) |

## 07. පර්යේෂණ හා සංවර්ධන සහකාර - තනතුරු 05

**සුදුසුකම් හා පළපුරුද්ද**

- **බාහිර අයදුම් කරුවන් සඳහා**

**(අ)** අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

i.සිංහල /දෙමළ භාෂාව

ii.ගණිතය

යන විෂයන් ඇතුලුව විෂයයන් හතරකට (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

**සහ**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂයධාරාවෙන් හෝ කෘෂිකර්ම විෂය සහිතව අවම වශයෙන් විෂයන් 03ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 04 සමත් වි තිබීම අවශ්‍යවේ.)

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය-ශිල්පීය නොවන අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන් හි පහත (ආ),(ඇ)සහ (ඉ) සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

i.සිංහල /දෙමළ භාෂාව

ii.ගණිතය

යන විෂයන් ඇතුලුව විෂයයන් හතරකට (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් (06)කින් සමත්ව තිබීම.

(ඇ).සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ).නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකොට තිබිය යුතුය.

සටහන : යම් තනතුරකට ස්ථිරව පත්කිරීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවයකර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ජේදයක් ඉහත "ඉ " ජේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ජේද ඉහත "ඉ " ජේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

| | | |
|---|---|---|
| **වැටුප් කාණ්ඩය** | - | MA 1-1 2016 |
| **වැටුප් ප්‍රමාණය** | - | රු. 27,910-10X300-7X350-4X495-20X660-48,540 |
| **වයස** | - | අවු.18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය.(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.) |

## 08. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) - තනතුරු 05

**සුදුසුකම් හා පළපුරුද්ද**

- **බාහිර අයදුම්කරුවන් සඳහා**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

i.සිංහල /දෙමළ භාෂාව

ii.ගණිතය

iii.ඉංග්‍රීසි

යන විෂයන් ඇතුලුව විෂයයන් හතරකට (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06)කින් සමත්ව තිබීම.

සහ

(ආ)අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 03ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 04 සමත් වී තිබීම අවශ්‍ය වේ)

(ඇ) පරිගණක වදන් සැකසුම /යතුරු ලියන පිළිබඳ තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන් හි පහත (ආ),(ඇ),(ඈ)සහ (ඉ) සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

i.සිංහල /දෙමළ භාෂාව

ii.ගණිතය

iii.ඉංගිසි

යන විෂයන් ඇතුලුව විෂයයන් හතරකට (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් (06) කින් සමත්ව තිබීම.

(ඇ).පරිගණක වදන් සැකසුම /යතුරු ලියන පිළිබඳ තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.

(ඈ).සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ).නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකොට තිබිය යුතුය.

| | | |
|---|---|---|
| **වැටුප් කාණ්ඩය** | - | MA 1-1 2016 |
| **වැටුප් ප්‍රමාණය** | - | රු. 27,910-10X300-7X350-4X495-20X660-48,540 |
| **වයස් සීමා** | | අවු.18ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ. |

❖ **වෙනත් කොන්දේසි :**

**ඉහතින් සඳහන් කර ඇති සුදුසුකම් වලට අමතරව සෑම තනතුරක් සඳහාම ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක්ම,**

i.ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii.තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii.විශිෂ්ට චරිතයෙන් යුක්තවිය යුතුය.

**අයදුම්පත්,**

* ජීව දත්ත හා තනතුර සඳහා ඉල්ලා ඇති අධ්‍යාපන සුදුසුකම් වෘත්තීය සුදුසුකම් විස්තර ඇතුලත්කර එම සුදුසුකම් සනාථකළ හැකි සහතිකවල පිටපත් සමග අයදුම්පත් ඉදිරිපත්කළ යුතුය.එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ /සංස්ථා/මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානින් මගින් එවිය යුතුය.

*අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කළ යුතුය.

*ඔබ විසින් අයදුම්කරනු ලබන එක් එක් තනතුරු සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත්‍ර ඉදිරිපත්කළයුතු අතර ඉල්ලුම්කරන තනතුරු පැහැදිලිව අයදුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

( කණිෂ්ඨ කළමනාකරණ (JM) සහ කළමණාකරණ (MM) සේවා ගණයේ තනතුරු සඳහා ඇමුණුම I අයදුම් පත්‍රය හා මාණ්ඩලික නොවන සේවා ගණයන්හි තනතුරු සඳහා ඇමුණුම II අයදුම්පත්‍රය භාවිතා කරන්න.)

සියලුම ඉල්ලුම් පත් 2024.03.20 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ සභාපති කිතුල් සංවර්ධන මණ්ඩලය, 9 වන මහල, සෙත්සිරිපාය II අදියර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

*ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත.මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික බලපෑම් ඒ සඳහා නුසුදුසු කමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

*අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**සභාපති,**
**කිතුල් සංවර්ධන මණ්ඩලය,**
**9 වන මහල,**
**සෙත්සිරිපාය II අදියර,**
**බත්තරමුල්ල**